**මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම - 2016**

----------------------------------------------------------------

මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම

------------------

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතට අනුකූලව 1987 මාර්තු 18 දින සිට බලපැවැත්වෙන පරිදි පෞද්ගලික සමාගමක් ලෙස 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර තිබූ මෙම සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 දෙසැම්බර් 01 දින නැවත ලියාපදිංචි කර තිබුණි.

## 1.5 සමාගම විසුරුවා හැරීම

2012 අගෝස්තු 13 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නිර්දේශ ප්‍රකාරව, එම වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වන විට සමාගම ස්වේච්චාවෙන් ගණන් බේරා වසා දැමීමට 2012 සැප්තැම්බර් 28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. ඒ අනුව 2014 නොවැම්බර් 20 දිනැති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සමාගම ඈවර කිරීම සඳහා ඈවරකරුවකු පත් කර තිබුණි. සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට මුලින් තීරණයකර තිබුණද පසුව එම කාර්යය ණයහිමියන්ගේ ගණන් බේරා වසා දැමීමක් බවට පත්ව තිබුණු බව සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අංක පීවී 9854 හා 2016 ජුලි 25 දිනැති ලිපිය අනුව සනාථ විය. එම ලිපිය ප්‍රකාරව ණයහිමියන්ගේ රැස්වීමක් පවත්වා ඉදිරි කටයුතු සිදු කරන ලෙස දක්වා තිබුණද එවැනි රැස්වීමක් පැවැත්වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවුණු අතර 2017 දෙසැම්බර් 17 දින වන විටද සමාගමේ ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

## 1.6 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

අ. මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාකිරීම් මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි වේ.

ආ. - විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා නොමැති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

-----------------------------------------

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ කරගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇවරකිරීමට නියමිත සමාගමක සියළුම වත්කම්වල වර්තමාන උපලබ්ධි අගය ජංගම වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද වත්කම්වල ලියාඅඩුකළ අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමේ දැන්වීම් අනුව පොළී ආදායම රු. 854,773 ක් වුවත් ආදායම් ප්‍රකාශනයේ රු. 908,537 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 53,764 කින් ආදායම් හා ලැබිය යුතු ආදායම් වැඩියෙන් දක්වා තිබූ අතර නාමික බදු සහනය (Notional Tax credit) රු. 5,377 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගන්නා අවස්ථාවේදීම ඊට අදාළ පොලිය උපලබ්ධි වී තිබියදී ලැබිය යුතු පොලිය ලෙස රු.174,924 ක් දක්වා තිබූ අතර කලින් ලද පොළී ආදායම රු.25,842 ක් වගකීම් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමේ දැන්වීම් අනුව භාණ්ඩාගාර බිල්පත් වටිනාකම රු.9,797,800 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 9,839,619 ක් ලෙස දක්වා තිබීමෙන් වත්කම් රු. 41,819 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

------------------------------------

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු | |
| (අ) | කාර්යාල උපකරණ | 1,346,930 | යාවත්කාලීන කල ස්ථාවර වත්කම් ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| (ආ) | මෝටර් රථ | 116,303 | |
| (ඇ) | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 149,604 | වටිනාකම හා භෞතික පැවැත්ම තහවුරු කිරීමේ ලියවිලි |
| (ඈ) | සිංගර් මහන මැෂින් | 29,480 | |
| (ඉ) | ණය ආයෝජන - ( ඊ ඊ සී) | 2,614,327 | ණය ගිවිසුම්/ණය ලිපිගොනු |
| (ඊ) | ණය ආයෝජන - ව්‍යාපෘති | 3,403,850 | |

| | | | |
|---|---|---|---|
| (උ) | අවිනිශ්චිත ව්‍යාපාරික ණය කපා හැරීම | 1,994,933 | ණය ලිපිගොනු හා ණය කපා හැරීම සඳහා අනුමැතිය |
| (ඌ) | බොල් සහ අඩමාන ණය කපා හැරීම | | |
| i. | ඊ. ඊ. සී. ව්‍යාපෘති ණය | 1,368,863 | |
| ii. | අනෙකුත් ව්‍යාපෘති ණය | 1,952,190 | |
| (එ) | වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑ ( ඩොලමයිට් ව්‍යාපෘතිය ) | 310,025 | ශේෂ සනාථ කිරීමේ ලියවිලි |
| (ඒ) | ලැබියයුතු ආදායම් බදු | 27,601 | අදාළ බදු උප ලේඛන හා වටිනාකම සනාථ කිරීමට අදාළ ලියවිලි |
| (ඔ) | දුරකථන තැන්පතු | 25,000 | තැන්පතු සනාථ කිරීමේ ලියවිලි |
| (ඕ) | ගෙවියයුතු විගණන ගාස්තු | 76,394 | (i) අදාළ විගණන පැවරුම් ලිපිය<br>(ii) ගාස්තු ප්‍රමාණය නිශ්චයකළ ආකාරය<br>(iii) අදාළ බිල්පත් |

### 2.3 ලැබිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු. 3,000,473 ක් වටිනා ලැබිය යුතු ණය ශේෂ 04 ක් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 42 (1) වගන්තිය ප්‍රකාරව රු. 100 ක් වූ සාමාන්‍ය කොටස්වලින් සමාගමේ ප්‍රාග්ධනය සමන්විත විය යුතු ලෙස දක්වා තිබුණද මෙම සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය පරිදි අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 3,000,000 කින් සමන්විත වී තිබුණි. එයින් කොටස් 1,039,800 ක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියටත් කොටස් තුනක් වෙනත් බාහිර පුද්ගලයින් නමටත් නිකුත් කර තිබුණද බාහිර පුද්ගලයින්ට නිකුත්කර තිබුණු කොටස් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.786,671 ක ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.135,108 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.921,779 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ ආදායම රු.396,237 කින් වැඩිවීම හා වියදම් රු.124,893 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම වෙනුවෙන් 2014 ඔක්තෝබර් 21 දින ඈවරකරුවකු පත්කර ඈවර කිරීමේ කටයුතු හා ගිණුම් පිළියෙල කිරීම් වෙනුවෙන් රු.125,000 ක් ගෙවීමට එකඟ වී තිබුණි. එකඟ වූ මුදලින් සියයට 50 ක් ලෙස රු.62,500 ක් 2015 ජනවාරි 13 දින ගෙවා තිබුණද ඈවර කිරීමේ කටයුතු 2018 මාර්තු මාසය දක්වාම අවසන් කර නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ගිණුම් සකස් කිරීම වෙනුවෙන් නැවතත්, රු.38,500 ක් ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම ගැටළු සහගත විය.

එසේම ඈවර කිරීමේ ගාස්තු හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ගාස්තු ගෙවීම සඳහා ලබාගත් අනුමැතිය ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණු එක්සත් රාජධානියේ කොළඹ මහ කොමසාරිස් කාර්යාලයට අයත් පිරිවැය රු.116,303 ක්වූ ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස අබලන් වී තිබුණු ලැන්ඩ් රෝවර් රථය ජාවත්ත මහවැලි ආරක්ෂක බලකා අනුබණ්ඩ පරිශ්‍රයේ නවතා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් සමාගමේ ඈවර කිරීමේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 ඔක්තෝබර් 06 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.